# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1958/76 - 2016 මාර්තු මස 19 වැනි සෙනසුරාදා - 2016.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපති විධානය

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන.

1. කේ. එල්. එල්. විජේරත්න මැතිතුමා
2. නිමල් බණ්ඩාර මැතිතුමා
3. දයානන්ද විදානගමච්චි මැතිතුමා
4. ජේ. චරිත රත්වත්තේ මැතිතුමා
5. මහාචාර්ය කිත්සිරි මඩපාත ලියනගේ මැතිතුමා
6. ලෙස්ලි ෂෙල්ටන් දේවේන්ද්‍ර මැතිතුමා
7. සුරේෂ් ෂාහ් මැතිතුමා
8. සනත් ජයන්ත එදිරිවීර මැතිතුමා
9. වී. රෙගුනාදන් මැතිතුමා
10. කමල් මුස්තාෆා මැතිතුමා
11. මහාචාර්ය ගුණපාල නානායක්කාර මැතිතුමා
12. නන්දපාල වික්‍රමසූරිය මැතිතුමා
13. සුජාතා කුරේ මැතිතුමිය
14. ජෙරී ජයවර්ධන මැතිතුමා
15. එස්. තිල්ලෙයිනඩරාජා මැතිතුමා
16. ආචාර්ය අනුර ඒකනායක මැතිතුමා
17. සෙම්බකුට්ටිගේ ස්වර්ණජෝති මැතිතුමා
18. පී. කේ. යූ. නිලන්ත පියරත්න මැතිතුමා
19. එන්. එච්. පතිරණ මැතිතුමා
20. එච්. ටී. දයානන්ද මැතිතුමා
21. ටී. බී. මඩුවේගෙදර මැතිතුමා
22. වෛද්‍ය විමල් කරඳගොඩ මැතිතුමා
23. ඒ. කදිරවේලුපිල්ලෙයි මැතිතුමා



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙත,

සුභාශිංසන පෙරටුවයි !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2016 මාර්තු මස 03 වැනි දින දරන ජනාධිපති විධානය මගින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව පිහිටුවනු ලැබූ හෙයින් ද,

තව ද, යථොක්ත කොමිෂන් සභාවෙන් අපේක්ෂිත ප්‍රතිඵලවල ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි මානව සම්පත් නියෝජනයන් ඉතා වැදගත් සාධකයක් බැව් හඳුනාගෙන ඇති බැවින් ද,

තව ද, මෙම කොමිෂන් සභාවේ සාමාජික සංයුතියෙහි විවිධත්වය තව දුරටත් පුළුල් විය යුතු යැයි පෙනී යන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම සුරංග නාවුල්ලගේ මැතිතුමාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, එකී සුරංග නාවුල්ලගේ මැතිතුමා පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස මෙයින් පත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහසයක් වූ මාර්තු මස 18 වැනි දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

04 - 399

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.